# නෝවාගේ නැව

– 4th Story–



23Page

**පොතේ ගුරා** ආදම් සහ ඒවගේ කාලයේ සිට බොහෝ කාලයකට පසුව භූමියේ මනුෂ්‍ය වර්ගයා වැඩි වීමක් සිදු වුණා. දෙවියන්වහන්සේ පොළොවේ මනුෂ්‍යාගේ දුෂ්‍යභාවය දුටුවා. ඉන් උන්වහන්සේ දුකට පත්වූවා.

**දෙවියන්වහන්සේ** ලෝකය දූෂිතව ප්‍රචණ්ඩකාරීව තිබෙන්නේ ය. මම මනුෂ්‍යා සෑදූ බැවින් තැවී ශෝකයට පත්ව සිටිමි.
මා විසින් මනුෂ්‍යා භූමිය මතු පිටින් නැතිකර දමන්නෙමි.

**පොතේ ගුරා** එසේ වුවත් පොළොවේ එක් යහපත් මනුෂ්‍යයෙක් සිටියේය. ඔහුගේ නම නෝවාය. නෝවා අසල්වාසීන්ටත්, දෙවියන්වහන්සේටත් ප්‍රේම කළේය.
නෝවා දෙවියන්වහන්සේ සමඟ හැසුරුණේය.
දෙවියන්වහන්සේ ඔහුව තෝරා ගත්තේ ය.


**දෙවියන්වහන්සේ** නෝවා... පොළොවේ මාංශමය වූ සියල්ලන් විනාශ කරන පිණිස මම ජලගැල්මක් පොළොව පිටට එවමි. එහෙත් නුඹ සමග මාගේ ගිවිසුම පිහිටුවන්නෙමි. මම නුඹ සහ නුඹේ පවුලත්, මාංශමය වූ පණ ඇති සත්-වයන්ගේ එක එක වර්ගයේ ගැණු පිරිමි දෙදෙනා බැගින් ගලවා ගත්තෙමි. ඔබ කන්ද මුදුනට ගොස් නැවක් සාදාන්න.

**පොතේ ගුරා** දෙවියන්වහන්සේ අණ කළ සේම, නෝවා ගෝෆෙර් ලී වලින් විශාල නැවක් සාදන්නට ආරම්භ කළේය.
බොහෝ ජනතාව පැමිණ රොකවීන්නට වූහ.

**මිනිසා** හූ... හූ... නෝවා අන්තිමට මෝඩයෙක්. ඔහු කන්ද මුදුනේ නැවක් හදනවා. නමුත් වතුරත් ඇත්තෙත් නෑ.

**කාන්තාව** හූ...හූ...හූ... එයාට ඇත්තටම පිස්සු. එයා කියන්නේ ගං වතුරක් එනවලු. අහස පැහැදිලිව තියෙද්දීත් වහනිවා ද? ඔහුට සිහිවිකල් වෙලා.

..............................................................................................



25Page

**පොතේ ගුරා** දෙවියන්වහන්සේගේ මගපෙන්වීමට අනුව, උන්වහන්සේ අණ කළ ආකාරයට නෝවා නැව සෑදුවේය. ජීවමාන වූ පණ ඇති සත්වයන්ගෙන්, ගැණු පිරිමි වශයෙන් දෙදෙනා බැගින් නැවට ඇතුල් වුණේය.

**දෙවියන්වහන්සේ** අද පටන් සත් දවසකින් පසුව දහවල් සතළිසක් ද, රෑ සතළිසක් ද පො-ළොව පිට වැසි වස්වන්නෙමි.

**පොතේ ගුරා** ඒ දවසේ දී ජීවමාන සත්වයන් ජාති 2 බැගින්, නැවට ඇතුල් වුණා. අලියා, සිංහයා, ජිරාෆ්, අහසේ පියාසර කරන පක්ෂීන් විවිධ සතුන්ගෙන්, නැව පිරී තිබුණා. මිනිසුන් අතුරෙන් නෝවා ද, ඔහුගේ භාර්යාව ද, ඔවුන්ගේ පුත් ෂෙම්, හාම්, යපෙත් හා ඔවුන්ගේ භාර්යාවන් ද ඇතුලුව 08 දෙනෙක් නැවට ඇතුල් වුණා.



26Page

පොතේ ගුරා — නැවේ දොරවල් වැසුණායින් පසුව අහසෙන් වර්ෂාව ඇද හැලෙන්නට පටන්ගත්තා. අහස විවර වී ධාරානිපාත වැස්ස වැටෙන්නට වණා. ජලය පොළොව පිට අතිශයින් බලවත් විය. ජල මට්ටම පොළොව වැඩි වී උස් වුණා. නෝවා ද, ඔහුගේ පවුලත්, නැවත්, සතුන් ද හැර අන් සියල්ලම විනාශ වූයේය.

..................................................................................................



27Page

පොතේ ගුරා — දින 40 කින් පසුව, එනම් 40 වන දවසේ වර්ෂාව නතර වීය.
මුළු භූමිය ජලයට යට වී කිසිවක්ම ඉතුරු නොවී, සොයා ගැනීමටවත් කිසිවක්ම තිබුණේ නැත.
නමුත්, නෝවා සහ පවුල ද, සත්වයන් ද සුරක්ෂිතව සිටියෝය.
එක් දවසක දී නෝවා පරවියෙකු පිටතට යැවීය. ඌ පිටතට ගොස් මුලු පොළොව මතුපිට ජලය තිබුණු බැවින් පරවියා උගේ පතුල තබන්ට තැනක් නොලැබ ඔහු නැවට හැරී ආවේය.
සත් දවසක් බලා නැවතත් පරවියා නැවෙන් පිටතට ඇරියේය. මෙයින් පසු පරවියා සවස් වේලේ අමු ඔලීව කොළයක් උගේ තුඩෙහි රැගෙන ආවේය. මෙයින් පොළොවේ ජලය බැසගිය බව නෝවා දැන ගත්තේ ය.

..................................................................................................



28Page

පොතේ ගුරා — දින 370 කින් පොළොවේ සියලු ජලය සිඳී ගියේය.
දෙවියන්වහන්සේ නෝවාට කතා කළේය.

දෙවියන්වහන්සේ — නුඹද, නුඹ සමඟ, නුඹේ පවුල නැවෙන් පිටතට එන්න.

පොතේ ගුරා — නෝවා සහ පවුල නැවෙන් පිටතට ආවේය. සත්වයන්ද නැවෙන් පිටතට ආවේය. නෝවා ස්වාමින්වහන්සේට පූජාසනයක් ගොඩනඟා පූජාසනය පිට දවන පූජාවක් පිදුවේය.

දෙවියන්වහන්සේ — මනුෂ්‍යා නිසා භූමියට තවත් ශාප නොකරන්නෙමි.

පොතේ ගුරා — දෙවියන්වහන්සේ වළාකුළු මත දේදුන්න පිහිටුවේය. නැවත වතුර කරණකොටගෙන මේ පොළොව විනාශ නොකරන බවට ගිවිසුමේ සළකුණක් බවට දේදුන්න පිහිටුවා තිබුණේය.

..................................................................................................

**ජීවිතයට අදාල කිරීම** — දුවේ පුතේ, දෙවියන්වහන්සේට භය ඇති, උන්වහන්සේට ආදරේ කරන අය කුමන විපතකින් වුවත් දෙවියන්වහන්සේ මුදවා ගන්නවා.
දේව භය අපට ඇති එකම ආරක්ෂාවයි.